**නාරම්මල ප්‍රාදේශීය සභාව - 2021**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

නාරම්මල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පැවති රු.5,631,162 ක් වටිනාකම වූ වත්කම් 04 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.24,000,000 ක් මූල්‍ය ප්‍රකාශනවල භෞතික සැලසුම් මංමාවත් ඉඩම් ගොඩනැගිලි වැඩසටහන් යටතේ දැක්විය යුතු වුවත් පොදු පරිපාලන වැඩසටහන යටතේ දක්වා තිබුණි. | පොදු පරිපාලනයේ වෙනත් ආදායම් යටතේ දැක්වීම නිවැරදි බව දන්වමි. | මුද්දර ගාස්තු ආදායම භෞතික සැලසුම් මංමාවත් යටතේ දැක්විය යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.57,703,255 ක් ආදායම් වියදම් ගිණුමේ රු.58,467,100 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.763,845 ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය රු.4,571,643 ක් රු.4,336,598 ක් ලෙස රු.235,045 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | වෙනසට හේතුව වැන්දඹු අනත්දරු ප්‍රතිපූර්ණ මුදල වේ. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ රු.281,300 ක ප්‍රචාරක දැන්වීම් ගාස්තු ආදායම ගිණුම්වල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති,රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති,රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132 වගන්තිය | යොමුගත වගන්තියෙන් ආවරණය නොවන කටයුත්තක් වන විශ්‍රාමික ගුරු මන්ත්‍රී මණ්ඩලයට උපහාර දැක්වීම සඳහා රු.450,080 ක මුදලක් වැයකර 2021 පෙබරවාරි 09 වන දින සභා සම්මුතිය මත සමරුඵලක 78 ක් ලබා දී තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමා ගේ අනුමැතිය ලැබී ඇති බව දන්වා සිටිමි. | පනතේ 132 වගන්තියෙන් ආවරණය වන වියදම් දැරිය යුතු වේ. |
| (ආ) | 2015 නොවැම්බර් 02 දිනැති අංක 2015/01 දරන වයඹ පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය | ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක් වෙනුවෙන් පවත්වනු ලැබූ දානමය පුණ්‍ය කටයුත්ත සඳහා රු.100,000 ක ආධාර මුදල් මහා සභා තීරණයක් මත අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව ලබා දී තිබූ අතර, එවැනි වියදම් චක්‍රලේඛය මඟින් ආවරණය වී නොමැති අතර, සභා බල ප්‍රදේශයෙන් පිටත ආධාර ලබා දී තිබුණි. | මුදල් ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලැබී ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. |

## 1.8 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹදෙණිය ප්‍රාථමික විද්‍යාලයේ නව පංතිකාමරය ඉදිකිරීම සඳහා රු.1,000,000 ක මුදලක් ඉදිකිරීම් ද්‍රව්‍ය ලබාදීම සඳහා ආධාර කර තිබුණි. ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියෙන් ආවරණය නොවූ හා 2021 වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුලත් නොකර පාසැල්වල පංති කාමර අධ්‍යාපන වැය ශීර්ෂයේ සිදුකල යුතු වියදම් සභා අරමුදලින් දරා තිබුණි. | දඹදෙණිය ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ ඉල්ලීමක් මත ද්‍රව්‍යාධාර ලබාදීම සිදුකරන ලදී. මේ සඳහා ආණ්ඩුකාර අනුමැතිය ලැබී ඇති බව දන්වා සිටිමි. | අධ්‍යාපන වැය ශීර්ෂයෙන් කළ යුතු වියදමක් වන අතර අයවැයගතකර චක්‍රලේඛ උපදෙස් වලට අනුව වැය කළ යුතුවේ. |
| (ආ) | සෞඛ්‍ය වැය ශීර්ෂයට අදාල කටයුත්තක් වන දඹදෙණිය කොවිඩ් වාට්ටුවේ දැඩි සත්කාර ඒකකයට අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.1,640,000 ක මුදලක් | හදිසි අවශ්‍යතාවය අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ වාචික උපදෙස් හා පළාත් පාලන කොමසාරිස් තුමාගේද | මෙම වියදම සෞඛ්‍ය වැය ශීර්ෂයට අදාල වියදමක් වන අතර, |

| | | |
|---|---|---|
| ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව වැයකර තිබුණි. | උපදෙස් අනුව දඹදෙණිය රෝහලේ කොවිඩ් වාට්ටුවේ දැඩි සත්කාර ඒකකය සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ආධාර ලබාදීම සිදුකරන ලදී. | ප්‍රාදේශීය සභාවට අදාල වියදම් හඳුනාගෙන වැයකල යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.23,636,609 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.18,040,622 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ස්ථාන කුලී වලින් රු.249,106 ක ශේෂයක් ද, ටෙන්ඩර් බදු කුලී රු.576,271 ක මුදලක්ද අයකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ මුදල් කාලීනව අයකර ගත යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබදව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩහපොළ මේරිලැන්ඩ් වෙන්දේසි ඉඩම 04 වන අදියර යටතේ අක්කර 3 රූඩ් 1 පර්චස් 38 ක පොදු ඉඩම් කොටසක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මෙසේ සභාවට ලැබිය යුතු ඉඩම් කොටස් ලබා ගැනීමට කටයුතු නොකිරීම තුළින් අයථා ගනුදෙනු සිදුවීමට ඉඩ ඇති බවද නිරීක්ෂණය කෙරේ. ඉහත ඉඩම කොටස්කර විකිණීමේදී ඒ සඳහා කට්ටි සැලසුම් අනුමත කිරීමේදී තිබූ කොන්දේසි වන මාර්ග නිසි පරිදි තාර දමා සංවර්ධනය කර නොතිබුණු අතර, කාණු ප්‍රමිතියට හා තාක්ෂණික උපදෙස් මත සිදු නොකිරීම හේතුවෙන් කාණු කැඩී පස්වලින් පිරී තිබුණි. | අක්කර 02 රූඩ් 03 පර්චස් 10 ක ඉඩම් ප්‍රමාණයක් අදියර 02 යටතේ වෙන්කර දී ඇති බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පොදු කටයුතු සඳහා ඉඩම් ලබාගත යුතුවේ. |

**3.2 ප්‍රසම්පාදන**

**3.2.1 සැපයීම් හා සේවා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාල ගොඩනැගිල්ල පරිගණක ජාලගත කිරීම හා ආරක්ෂිත කැමරා පද්ධතිය සවිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් මෙම සේවාව ඉටුකර ගැනීම සඳහා තෝරාගෙන 2021 ජූනි මස 08 දින රු.1,192,010 ක මුදලකට ගිවිසුම් ගත වී තිබුණි. අත්තිකාරම් සුරක්ෂණය නොමැතිව රු.382,402 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ගිවිසුම අනුව මෙම කර්මාන්තය මාසයක කාලයක් තුල ඉටුකර භාර දිය යුතු වුවද දෙවන මහලේ වැඩ නිම නොවීම හේතුවෙන් CCTV පද්ධතියේ කටයුතු අවසන් කිරීම ප්‍රමාද වුවද මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 80 ක් වූ රු.1,034,661 ක මුදලක් 2021 ඔක්තෝබර් 09 දින ගෙවීම් කර තිබූ අතර ගිවිසුමෙහි අංක 1,3,6 යන කොන්දේසි ඉටුකර ගත නොහැකිව පැවතුණි. | පරිගණක ජාලය සහ කැමරා පද්ධතියට අදාළ භෞතික සවිකිරීම් පිළිබඳව සලකා බලා නිමකර ඇති වැඩ ප්‍රමාණය අනුව 80% ක පමණ වටිනාකමකින් යුත් වැඩ කොටසක් අවසන් කර ඇති අතර, ගිවිසුමෙ 1,3,6 කොන්දේසි ඉටුකර ගත නොහැකි වූයේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම නිසා බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව සැපයීම් හා සේවා ඉටු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලෙහි තිරරෙදි දැමීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3:2 හා 3:4 වලට අනුකූල නොවී ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ වැඩිහිටි සමිතියක් සමඟ රු.1,635,298 ක මුදලකට ගිවිසුම් ගත වී තිබුණි. සැපයුම්කරුවකු තෝරා නොගෙන මෙම කාර්යය ඉටු කිරීමට සමිතියක් වෙත පැවරීමෙන් සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා අවස්ථාව ලබාදී නොතිබුණි. අත්තිකාරම් සුරක්ෂණයක් නොමැතිව ගිවිසුම්ගත මුදලින් සියයට 20 අත්තිකාරම් මුදලක් එනම් රු.327,060 ක් ගෙවා තිබුණි. මෙම සමිතිය විසින් ඉටුකර තිබුණේ මාර්ග කොන්ක්‍රීට් කිරීම, ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම වැනි ව්‍යාපෘති වන අතර මෙවැනි ව්‍යාපෘති සිදුකරන සමිතියක් මඟින් තිරරෙදි දැමීම වැනි කර්මාන්තයක් ඉටුකිරීමේ හැකියාවක් පවතින්නේද යන්න විගණනයේදී ගැටළු සහගත විය. | ව්‍යාපෘති පිරි නැමීමේ දී සමිති විසින් පෙර ඉටුකරන ලද කර්මාන්ත සැලකීමේ දී, මෙම සමිතිය ඉටුකර තිබුණේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති පමණි. නමුත් මෙම සමිතිය සතුව තිරරෙදි නිර්මාණය කිරීමේ දක්ෂතාව පවතින බවට ඔවුන් විසින් ගරු සභාපතිතුමාව දැනුවත් කර ඇත. එම විශ්වාසය මත ගරු සභාපතිතුමා විසින් ඔවුන් සඳහා මෙම ව්‍යාපෘතිය පිරිනමන ලදී. | සැපයීම් හා සේවා ඉටුකර ගැනීමේ දී ඒ සඳහා සුදුසු සැපයුම්කරුවන් තරඟකාරීත්වයෙන් යුතුව තෝරාගත යුතුවේ. |